"දකුණේ සිංහලයා පරාජය කිරීමට සජිත්ට ඡන්දය දෙන්න" යනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් පැවසුවේයැයි දැක්වෙන සිරස්තලයකින් යුත් ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වූ අතර, සමාජ මාධ්‍ය ජාලා ඔස්සේද එම පුවත පදනම් කරගනිමින් මන්ත්‍රී සුමන්දිරන් හට දැඩි විවේචනයන් එල්ල වී තිබිණි. එසේම මෙම පුවතේ අන්තර්ගතයේද "ගෝඨාභය රාජපක්ෂ දිනවීමේ දකුණේ සිංහල ජනතාවගේ හා සිංහල නායකයන්ගේ ජයග්‍රහණය නැවැත්වීම වෙනුවෙන් දෙමළ ජනතාව එක්ව කටයුතු කළ යුතුයි" යනුවෙන් මන්ත්‍රී සුමන්දිරන්ව උපුටා දක්වමින් සඳහන්ව තිබිණි.

කෙසේ වෙතත් ගැටළුව වන්නේ මෙම කරුණු කෙතරම් නිවැරදිද වන්නේද යන්නයි. අප විසින් මේ සම්බන්ධයෙන් විමසීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන්ව සම්බන්ධ කොට ගත් අතර, එහිදී ඔහු ස්ථිරවම පවසා සිටියේ තමන් විසින් උක්ත සිරස්තලයේ දැක්වෙන ආකාරයේ ප්‍රකාශයක් හෝ අන්තර්ගතයේ උපුටා දක්වා ඇති ආකාරයේ ප්‍රකාශයක් කිසිදු තැනක සිදු නොකළ බවයි. එසේ නම් අරුණ පුවත්පත මගින් පළ කොට ඇති මෙම ප්‍රවෘත්තිය තුළට, පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් නොකළ ප්‍රකාශයක් පැමිණියේ කෙසේද යන්න බැරෑරුම් ලෙසින් සොයා බැලිය යුතු කරුණකි.

සාවද්‍ය කරුණු ජනගත කිරීම මෙන්ම, යම් කිසිවෙකු විසින් ප්‍රකාශ නොකළ කරුණක් ප්‍රකාශ කළා යැයි දක්වමින් එම පුද්ගලයාව උපුටා දක්වා පළ කිරීමද බරපතල මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව නොකිවමනායි. විශේෂයෙන්ම රටේ ජනාධිපතිවරණය පැවැත්වීමට ආසන්න කාලයේදී මෙවන් සාවද්‍ය පුවත් පළ කිරීම කෙතරම් ගැටළුකාරීද යන්න අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ.

#mediaethicsSL #SinhalaPress #lka #Aruna